# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 34 දරන

# මහනුවර ඇසළ පෙරහැර භාරය පනත

---

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 80 යි. නැපැල් ගාස්තුව : ශත 35 යි.

1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 40/80.

ඇසළ පෙරහැර පැවැත්වීම සඳහා මහනුවර ශ්‍රී දළදා මාලිගාවට ද සතර මහා දේවාලවලට ද මුදලින් සහ වෙනත් ආකාරවලින් ආධාර දීමේ කාර්යය සඳහා මහනුවර ඇසළ පෙරහැර භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (1) 6 වන වගන්තියෙහි සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහනුවර ඇසළ පෙරහැර භාරය" යනුවෙන් හැඳින්වෙන භාරයක් පිහිටුවනු ලැබිය යුතු ය. මහනුවර ඇසළ පෙරහැර භාරය පිහිටුවීම.

(2) භාරය (1) වන උපවගන්තියෙන් එයට පවරනු ලබන නාමයෙන්, සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තව ද ඒ නාමයෙන් භාරය විසින් නඩු පැවරීම ද භාරයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක භාරකාර මණ්ඩලයක් විසින් භාරය පරිපාලනය කරනු ලැබිය යුතු ය :— පාලක භාරකාර මණ්ඩලය සහ රැස්වීම.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ;

(ආ) මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයෙහි දිසාපතිවරයා ; සහ

(ඇ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, මහනුවර සතර මහා දේවාල අතුරින් එකක බස්නායක නිලමේ.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයා එසේ පත් කරනු ලැබුවේ යම් ධුරයක බලය ප්‍රකාර ද, ඔහු ඒ ධුරය දරන තාක් කල් පමණක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධුරය දැරිය යුතු ය :

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි අතර ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වල දී, මණ්ඩලයේ සභාපතිවරයා මූලාසනය දැරිය යුතු ය ; ඔහු පැමිණ නොමැති විට, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

2—ජ 0948—9,700 (80/08)

(4) සභාපතිවරයාට හෝ මණ්ඩලයේ රැස්වීමක මූලාසනය දරන වෙනත් සාමාජිකයකුට, ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය, සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතිය ද ඒ නොතකා මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලයේ සෑම රැස්වීමක් පිළිබඳ දැන්වීම 4 වන වගන්තියේ සඳහන් රක්ෂක භාරකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය. ඔහුට ඒ රැස්වීමට සහභාගි විය හැකි වුව ද ඒ රැස්වීමේ දී ඡන්දය දීමට හිමිකම් නොතිබිය යුතු ය.

රක්ෂක භාරකරු.

4. මහා භාරකාර ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද මහා භාරකාරවරයා, භාරයේ රක්ෂක භාරකරු විය යුතු ය.

භාරයේ මුද්‍රාව.

5. (1) භාරයේ මුද්‍රාව මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයෙහි තිබිය යුතු අතර, මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ තමන් පැමිණ සිටි බව පෙන්නුම් කිරීමේ සංකේතයක් වශයෙන් යම් සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අත්සන් කළ යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර ඒ මුද්‍රාව ඒ සාධන පත්‍රයට හෝ ලියවිල්ලට නොතැබිය යුතු ය.

(2) මුද්‍රාව තබනු ලබන්නේ යම් සාධන පත්‍රයක ද, නැතහොත් ලියවිල්ලක ද ඒ සාධන පත්‍රයෙහි නැතහොත් ලියවිල්ලෙහි විස්තර ඇතුළත් කළ යුතු ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

භාරයේ පරමාර්ථ.

6. භාරයේ පරමාර්ථ—

(අ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර පැවැත්වීම පිණිස, මහනුවර ශ්‍රී දළදා මාලිගාවට සහ සතර මහා දේවාලවලට මුදල් සහ වෙනත් ආධාර සැලසීම;

(ආ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ කලාත්මක සහ සංස්කෘතික අගය නංවාලන ජාතික කලා සහ නැටුම් දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) යම් කලාකරුවන්ගේ සහ ශිල්පීන්ගේ සේවා නිසා මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරේ සංස්කෘතික සහ කලාත්මක අගය වැඩි දියුණු විය හැකි ද ඒ කලාකරුවන්ට සහ ශිල්පීන්ට මුදල් ආධාර සැලසීම;

(ඈ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරෙහි දී උපයෝගී කර ගත යුතු භාණ්ඩ නිෂ්පාදනයෙහි නිරතවීම;

(ඉ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරට සහභාගි වන කලාකරුවන් සහ නැටුම්කරුවන් සඳහා තරඟ පැවැත්වීම සහ ඔවුන්ට ත්‍යාග, සහතික සහ වෙනත් ආකාරයේ සම්මාන ප්‍රදානය කිරීම

විය යුතු ය.

භාරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

7. (1) භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ඊට හිතකර වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු දේ භාරයේ නාමයෙන් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය :—

(අ) භාරයට අයිති යම් නිශ්චල හෝ චංචල දේපළක් විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, ප්‍රදානය කිරීමට, සමර්පණය කිරීමට, උරුම කිරීමට, පැවරීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට රක්ෂක භාරකරුට විධාන කිරීම :

එසේ වුව ද රුපියල් එක් ලක්ෂයකට වැඩි ගණනාකට තක්සේරු කරන ලද නිශ්චල දේපළක් විකුණනු ලබන, උකස් කරනු ලබන, බදු දෙනු ලබන හෝ අන්‍යාකාරයකින් ඒ පිළිබඳව කටයුතු කරනු ලබන අවස්ථාවක, ඒ ගනුදෙනුව සඳහා දිසා අධිකරණයේ අනුමැතිය ලබා ගැනීම පිණිස, ස්වාධීන තක්සේරුකරුවන් දෙදෙනකුගේ තක්සේරු වාර්තා දෙකක් සමඟ මහනුවර දිසා අධිකරණය වෙත මණ්ඩලය විසින් ඉල්ලීමක් කළ යුතු ය. රක්ෂක භාරකරු, ඒ ඉල්ලීමට වගඋත්තරකරුවකු කළ යුතු ය ;

(ආ) භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ප්‍රදාන, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව පිරිනැමීම ;

(ඇ) භාරයේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම සහ කාර්ය කිරීම සඳහා ද භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට සහ සම්මුතිවලට කෙළින්ම හෝ එහිලා මණ්ඩලය විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයන් සහ සේවකයන් හෝ අනුයෝජිතයන් හෝ මගින් එළඹීමට නැතහොත්, ඒ ගිවිසුම් සහ සම්මුති ඉටු කිරීම ;

(ඈ) මේ පනතේ විධිවිධානවලට යටත් ව, භාරයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම සහ සේවා නියුක්තයන් පත් කිරීම ද උසස් කිරීම ද ඔවුනට පාරිශ්‍රමික ගෙවීම ද ඔවුන්ගේ විනය පාලනය කිරීම ද ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ දීම ද පිළිබඳව රීති සෑදීම ;

(ඉ) භාරයේ මුදල් ආයෝජනය කිරීම සඳහා භාර ආඥාපනතින් හෝ වෙනත් යම් නීතියකින් බලය දෙනු ලැබූ යම් ආයෝජනවල භාරයට අයත් අරමුදල් ආයෝජනය කිරීම හා ආයෝජනය කරන ලද ඒ අරමුදල ආපසු ලබාගැනීම, නැවත ආයෝජනය කිරීම හා ඒ ආයෝජන වෙනස් කිරීම ;

(ඊ) භාරයේ පරිපාලනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම.

3—එ 50948 (80/08)

උපදේශක කමිටුව.

8. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය :—

(අ) ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ;

(ආ) මහනුවර සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන් සතරදෙනා;

(ඇ) මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා; සහ

(ඈ) ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන (මෙහි මින් මතු "නම් කරන ලද සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තිදෙනෙක්.

(2) නම් කරන ලද සාමාජිකයන් තිදෙනා මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් නැතහොත් ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ඔවුන් ධුරය කලින් හිස් කරනු ලැබුවහොත් මිස, අවුරුදු පහක කාලයක් ඔවුන් ධුරය දැරිය යුතු ය.

(3) ඉවත් කිරීමට හේතු කිසිවක් නොදක්වා, ජනාධිපතිවරයා විසින් යම් අවස්ථාවක දී, නම් කරන ලද සාමාජිකයකු ධුරයෙන් ඉවත් කර, ඒ වෙනුවට වෙනත් සාමාජිකයකු නම් කරනු ලැබිය හැකි ය. එසේ නම් කරනු ලැබූ සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවෙන් ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) ශ්‍රී දළදා මාලිගාවෙහි දියවඩන නිලමේ උපදේශක කමිටුවෙහි සභාපතිවරයා විය යුතු අතර, ඒ කමිටුවේ රැස්වීම්වල මූලාසනය ඔහු විසින් දැරිය යුතු ය. ඔහු පැමිණ නොමැති විට, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩිදෙනකු විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරිය යුතු ය.

(5) උපදේශක කමිටුවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

ඇතැම් කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් උපදේශක කමිටුව විමසිය යුතු බව.

9. (1) භාරය පරිපාලනය කිරීමෙහි ලා මණ්ඩලය විසින්, 8 වන වගන්තියෙහි සඳහන් උපදේශක කමිටුවේ සහාය ලබාගත හැකි අතර, මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී, ජනාධිපතිවරයා විසින් ලිඛිතව විධාන කරනු ලැබිය හැකි යම් කරුණු සම්බන්ධයෙන් ඒ උපදේශක කමිටුව විමසිය යුතු ය.

(2) යම් කරුණක් සම්බන්ධයෙන් ඒ උපදේශක කමිටුව විමසිය යුතු යයි මණ්ඩලයට නියම කරනු ලැබූ අවස්ථාවක දී, ඒ කරුණු ඒ උපදේශක කමිටුවේ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඒ තීරණයට එකඟවීමට හෝ ඒ තීරණය අනුගමනය කිරීමට මණ්ඩලයට නොහැකි වන අවස්ථාවක දී, ඒ තීරණය ගත්තා ලද දින සිට එක් මාසයක් ඇතුළත දී ඒ කරුණ පිළිබඳව වාර්තාවක් මණ්ඩලය විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව ජනාධිපතිවරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

භාරයෙහි අරමුදලක් පිහිටුවීම.

10. (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර ඇසළ පෙරහැර භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන භාරයේ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

රක්ෂක භාරකරුගේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

11. (1) රක්ෂක භාරකරු විසින්, අරමුදලේ චංචල හා නිශ්චල යන දෙවර්ගයේම සියලු වත්කම් රක්ෂක භාරකරු වශයෙන් තමාගේ නමින් භාරය වෙනුවෙන් දැරිය යුතු ය.

(2) රක්ෂක භාරකරු විසින් මණ්ඩලයේ විධාන අනුව සියලු ආයෝජන කිරීම් ද, ආයෝජන ආපසු ලබා ගැනීම සහ ප්‍රති ආයෝජන කිරීම් ද කළ යුතු ය.

(3) 12 වන වගන්තියේ (ඈ) ඡේදය යටතේ අරමුදලට ගෙවිය යුතු සියලු මුදල් අරමුදලේ තැන්පත් කරනු ලැබීම පිණිස, රක්ෂක භාරකරුට ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදලින් ලැබෙන ලාභාංශ සහ වෙනත් ආදායම් මණ්ඩලයට හෝ මණ්ඩලය විසින් ලියවිල්ලකින් විධාන කරනු ලබන යම් තැනැත්තන්ට හෝ එසේ විධාන කරනු ලබන යම් තැනැත්තන්ගේ බැරට එසේ විධාන කරනු ලබන යම් බැංකුවකට හෝ ගෙවීමට රක්ෂක භාරකරු විසින් ඉඩ දෙනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී ඒ ලාභාංශ හෝ වෙනත් ආදායම් යෙදවීම පිළිබඳ වගකීමෙන් ඔහු නිදහස් කරනු ලැබිය යුතු අතර ඒ ලාභාංශ හෝ වෙනත් ආදායම් සම්බන්ධයෙන් ඇති වන යම් පාඩුවක් නැතහොත් ඒ ලාභාංශ හෝ වෙනත් ආදායම් අයථා පරිදි යෙදීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු නොවන්නේ ය.

(5) භාරය වෙත කරනු ලබන සියලු ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග රක්ෂක භාරකරු විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ භාර ගනු ලැබිය යුතු අතර රක්ෂක භාරකරු හෝ ඒ තැනැත්තා විසින් ඒ වෙනුවෙන් කුවිතාන්සි නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට යටත්ව හා ඒවාට හානියක් නොමැතිව, භාර දේපළවලට අදාළ සියලු සුරැකුම් සහ හිමිකම් ලේඛන රක්ෂක භාරකරුගේ භාරයෙහි තිබිය යුතු නමුත් ඒවා බාධාවකින් තොරව පරීක්ෂා කර බැලීමට අයිතියක් ද ඒවායේ පිටපත් හෝ උද්ධෘත ගැනීමට හිමිකමක් ද මණ්ඩලයට තිබිය යුතු ය.

(7) රක්ෂක භාරකරුගේ එකඟත්වය අවශ්‍ය වන්නේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඒ කාරණය විශ්වාසය කඩ කිරීමක් වන්නේ නම් හෝ ඇරයුම් සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් ඔහු වෙත පෞද්ගලික වගකීමක් පැවරෙන කාරණයක් වන්නේ නම් හෝ මිස, මණ්ඩලය සතු කළමනාකාර බලතල හෝ වෙනත් යම් බලයක් හෝ අභිමතයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ හැකි වනු පිණිස අවශ්‍ය සියලු ක්‍රියාවල දී රක්ෂක භාරකරු එකඟ වී ඒ ක්‍රියා ඉටු කළ යුතු ය. මණ්ඩලය විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් රක්ෂක භාරකරු වගකීමකට යටත් නොවිය යුතු ය.

අරමුදලට කරනු ලබන ගෙවීම්.

12. (අ) ආණ්ඩුව විසින් කරනු ලබන ප්‍රාරම්භක ගෙවීම ;

(ආ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන යම් මුදල් ;

(ඇ) මුදලින් කරනු ලබන යම් ත්‍යාග හෝ පරිත්‍යාග සහ භාණ්ඩවලින් කරනු ලබන යම් ත්‍යාග හෝ පරිත්‍යාග විකිණීමෙන් ලැබෙන මුදල් ; සහ

(ඈ) භාරයට අයවිය යුතු වූ ද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නා වූ ද, ආයෝජනවලින් ලැබෙන ආදායම් හෝ වෙනත් ලැබීම්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

13. භාර ආඥාපනතේ හෝ භාර මුදල් ආයෝජනයට අදාළ වෙනත් යම් නීතියක හෝ විධිවිධානවලට අනුකූලව අරමුදලේ බැරට ඇති මුදල් ආයෝජනය කරනු ලැබිය යුතු අතර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා ඒ මුදල් යොදවනු නොලැබිය යුතු ය.

භාරය පුණ්‍ය භාරයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

14. භාරය, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ අර්ථානුකූලව පුණ්‍ය භාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් තීරුබදු සහ ගාස්තුවලින් භාරය නිදහස් කිරීම.

15. (1) භාරය විසින් භාණ්ඩ කිසිවක් ආනයනය කිරීම, භාරයේ පරමාර්ථ හා අරමුණු ප්‍රවර්ධනය කිරීමෙහි ලා හිතකර වන්නේ යයි සලකනු ලබන්නේ නම්, ඒ භාණ්ඩ සඳහා යම් තීරු බදු ගෙවීමෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් භාරය නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) මහා භාරකාර ආඥාපනතේ 52(1) වන වගන්තිය යටතේ සාදන ලද මහා භාරකාර රීති යටතේ මහා භාරකාරවරයාට ගෙවිය යුතු යම් ගාස්තු ගෙවීමට භාරය යටත් නොවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

16. (1) මණ්ඩලය විසින්, භාරයේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින්, සෑම වර්ෂයක දී ම භාරයේ ගිණුම් විගණනය කළ යුතු ය.

(3) භාරයේ වැඩ කටයුතු පිළිබඳව වාර්තාවක් මණ්ඩලය විසින් වර්ෂයක් පාසා පිළියෙල කොට ඒ වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණකාධිපතිවරයා විසින් ඒ වාර්තාව තම වාර්තාවත් සමග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. මුදල් පිළිබඳ ඒ වාර්තාව අදාළ වන්නේ යම් වර්ෂයකට ද ඒ වර්ෂයට පසුව එළඹෙන වර්ෂය ඉකුත් වීමට පෙර ඒ වාර්තා මහජනයාගේ දැන ගැනිම පිණිස ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

17. භාරයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. භාරයේ මුදල් වර්ෂය.

18. 12 වන වගන්තිය යටතේ අරමුදලට ගෙවනු ලැබූ මුදල් හැර, භාරයේ බැරට ඇති මුදල් පහත සඳහන් කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය:— භාරයේ වියදම්.

(අ) භාරයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ගෙවීම්;

(ආ) භාරය පරිපාලනය කිරීම, පිහිටුවීම සහ පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වියදම්;

(ඇ) නිලධරයන්ට, සේවකයන්ට සහ වෙනත් සේවා නියුක්තයන්ට වේතන ගෙවීම; සහ

(ඈ) භාරයේ පරමාර්ථ, ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්.

19. (1) රක්ෂක භාරකරු විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ (මෙහි මින් මතු "බලයලත් නිලධරයා" යනුවෙන් හඳුන්වනු ලබන) තැනැත්තකු විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ හැර සහ එහි දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව හැර අන්‍යාකාරයකින්, කිසිම තැනැත්තකු විසින් මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර බැලීමේ කාර්යය සඳහා ගාස්තුවක්, අය කිරීමක් හෝ යම් පහසුකමක් සඳහා විධිවිධාන සැලසීම නොකළ යුතු ය. ඒ කාර්යය සඳහා සපයනු ලැබූ ආකෘතියෙහි ඒ වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමක් මත එවැනි බල පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. බලපත්‍ර නිකුත් කිරීම.

(2) ඒ රක්ෂක භාරකරු විසින් හෝ බලය ලත් නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන තැනැත්තාට ඒ උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කළ යුතු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා වැඩිදුරටත් අවශ්‍ය විය හැකි යම් විස්තර ඉල්ලා සිටිය හැකි ය.

(3) රක්ෂක භාරකරු විසින් හෝ බලයලත් නිලධරයකු විසින්—

(අ) අවස්ථානුගත කරුණු අනුව ඒ යෝජිත ගාස්තුව හෝ අය කිරීම අධික හෝ අසාධාරණ බවට;

(ආ) සලසනු ලැබිය යුතු පහසුකම් ප්‍රමාණවත් නොවන බවට; හෝ

(ඇ) මහජන ආරක්ෂාව සාක්ෂාත් කිරීම සඳහා ගනු ලැබිය යුතු පූර්වෝපායන් ප්‍රමාණවත් නොවන බවට

හැඟීමට පත් වන්නේ නම්, ඔහු විසින් බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයෙහි පහත සඳහන් කොන්දේසි දැක්විය හැකි ය:—

(අ) අය කරගනු ලැබිය යුතු උපරිම ගාස්තුව හෝ අය කිරීම;

(ආ) සැලසිය යුතු පහසුකම්;

(ඇ) මහජන ආරක්ෂාව සාක්ෂාත් කිරීම සඳහා ගනු ලැබිය යුතු පූර්වෝපායන්.

වැරදි හා දණ්ඩන.

20. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භයේ සිට සහ ඉන් පසු—

(අ) මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර පැවැත්වීමේ කාර්යය සඳහා හෝ ඒ හා සම්බන්ධ යම් කරුණක් සඳහා හෝ රක්ෂක භාරකරුගේ පූර්ව ලිඛිත අනුමතය නොලබා මුදලින් හෝ ද්‍රව්‍යවලින් යම් දායක මුදලක් භාර ගන්නා හෝ එකතු කරන;

(ආ) රක්ෂක භාරකරු විසින් හෝ බලයලත් නිලධරයකු විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ හැර, මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර බැලීමේ කාර්යය සඳහා ගාස්තුවක්, අයකිරීමක් හෝ යම් පහසුකමක් සඳහා විධිවිධාන සලසන;

(ඇ) 19 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි සඳහන් බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි උල්ලංඝනය කිරීමෙහි ලා ක්‍රියා කරන

කවර හෝ තැනැත්තකු, වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්ම වන්නා වූ දඩයකට හෝ මාස හයක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩයට හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු ය.

මේ පනත යටතේ ක්‍රියා කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් සහ භාරයේ නිලධරයන් ආදීන් ආරක්ෂා කිරීම.

21. (1) මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද භාරයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි භාරය විසින් හෝ භාරයට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය විසින් දරන ලද යම් වියදමක් භාරයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරයට ගෙවන ලද හෝ භාරය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු භාරයේ අරමුදල්වලින් බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පරිදි (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගනු ලැබුවේ නම් මිස ද ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කළහොත් ද ඒ වියදම භාරයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

22. භාරයට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ භාරයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

භාරයේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු බව.

23. භාරයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව හා එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

භාරයේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

24. භාරය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

භාරය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—**

අර්ථ නිරූපණය.

" මහනුවර සතර දේවාලය " යන්නෙන්—

(අ) මහනුවර නාථ දේවාලය ;

(ආ) මහනුවර මහා විෂ්ණු දේවාලය ;

(ඇ) මහනුවර කතරගම දේවාලය ; සහ

(ඈ) මහනුවර පත්තිනි දේවාලය

අදහස් වේ.